ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

இலங்கைப் பாராளுமன்றம்

# Parliament of Sri Lanka



වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2016

වැය ශීර්ෂය
தலைப்பு
**Head** } 16

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

இலங்கைப் பாராளுமன்றம் ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே

**Parliament of Sri Lanka, Sri Jayewardenepurakotte**

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
# ශීර්ෂ අංකය 16
# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2016

## පටුන


| අංකය | විස්තරය | පිටු |
|---|---|---|
| 1. | මෙහෙවර | 3 |
| 2. | ප්‍රධාන කාර්යයන් | 3 |
| 3. | සංවිධාන ව්‍යුහය | 3- 5 |
| 4. | කාර්ය මණ්ඩල තොරතුරු | 5 |
| 5. | වාර්ෂික කාර්ය සාධනය | |
| 5.1 | මූල්‍ය පරිපාලනය | 6 - 12 |
| 6 | ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව | |
| 6.1 | ආංශික අධීක්ෂණ කාරක සභා | 13-15 |
| 6.2 | විශේෂ කාර්යයන් සඳහා වූ කාරක සභා | |
| | (i) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව | 16 |
| | (ii) තේරීම් කාරක සභාව | 16 |
| | (iii) වරප්‍රසාද පිළිබඳ කාරක සභාව | 16 |
| | (iv) උසස් නිලතල පිළිබඳ කාරක සභාව | 16 |
| | (v) ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව | 17 |
| | (vi) රාජ්‍ය ගිණුම් කාරක සභාව | 17-20 |
| | (vii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව | 20 - 22 |
| | (viii) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව | 22 |
| 6.3 | විශේෂ කාරක සභා | 22-23 |
| 6.4 | පනත් කෙටුම්පත් කාර්යාංශය | 23-26 |
| 6.5 | සභාලේඛන කාර්යාංශය | 26-27 |
| 6.6 | පාර්ලිමේන්තු කථා පරිවර්තක කාර්යාලය | 27 |
| 6.7 | පාර්ලිමේන්තු පුස්තකාලය | 27-28 |
| 7 | වේත්‍රධාරී දෙපාර්තමේන්තුව | 28-30 |
| 8 | පරිපාලන දෙපාර්තමේන්තුව | 30-32 |
| 9 | හැන්සාඩ් දෙපාර්තමේන්තුව | 32-33 |
| 10 | සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 33-34 |
| 11 | තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව | 33-34 |
| 12 | අභ්‍යන්තර විගණන කාර්යාංශය | 34 |
| 13 | විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය | 34-36 |
| **පාර්ලිමේන්තුවේ සංවිධාන ව්‍යුහය** | - රූපසටහන ( ඇමුණුම - 01 ) | 37 |

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ශීර්ෂ අංකය - 16
## වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2016

## 1. මෙහෙවර

ව්‍යවස්ථා සම්පාදකයන්, ජනතා නියෝජිතයන් සහ රටෙහි මහජන මුදල් භාවිතය සියුම් ලෙස පිරික්සන්නන් ලෙස සිය කාර්යයන් සඵලදායී සහ වඩා කාර්යක්ෂම ලෙසින් ඉටු කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට උපකාරී වන කාර්යය පටිපාටිමය උපදෙස් සහ පහසුකම් සැපයීම.

## 2. ප්‍රධාන කාර්යයන්

(i) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීම
(ii) රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පූර්ණ පාලනය ක්‍රියාත්මක කිරීම
(iii) විධායකය සම්බන්ධයෙන් අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම

## 3. සංවිධාන ව්‍යුහය

ගරු කථානායකතුමා ප්‍රමුඛත්වය දරන පාර්ලිමේන්තුවේ රාජකාරි කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යවන ලේකම් සහ කාර්ය මණ්ඩල සේවාවන් සැපයීම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යමණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යාලය පහත සඳහන් දෙපාර්තමේන්තු වලින් සමන්විත වේ:-

**( සංවිධාන ව්‍යුහය සඳහා කරුණාකර ඇමුණුම 01 බලන්න )**

1. වේත්‍රධාරී දෙපාර්තමේන්තුව
2. පරිපාලන දෙපාර්තමේන්තුව
3. ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව
4. හැන්සාඩ් දෙපාර්තමේන්තුව
5. සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව
6. මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව
7. ආහාරපාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව
8. තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව

### 3.1 වේත්‍රධාරී දෙපාර්තමේන්තුව

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නියමිත වේලාවට හා කාර්යක්ෂම අයුරින් පහත දැක්වෙන සේවාවන් හැකි ඉහළම අයුරින් සැපයීම මඟින් පාර්ලිමේන්තුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැපයීම :-

- උත්සව රාජකාරි, පාර්ලිමේන්තු සභාගර්භය තුළ විනය පවත්වාගෙන යාම, සෙංකෝලයේ භාරකාරත්වය හා ආරක්ෂාව, පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට අමුත්තන් ඇතුළු කිරීම සහ ගැලරි අධීක්ෂණය.

- පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සංරක්ෂණය සහ පාර්ලිමේන්තු සංකීර්ණය තුළ ඉඩකඩ වෙන් කිරීම.

- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ යෝෂ්යතා ලේඛන පිළියෙල කිරීම, පාර්ලිමේන්තු සභා ගර්භයෙහි ආසන වෙන් කිරීම සහ ආසන සැලැස්ම මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

## 3.2 පරිපාලන දෙපාර්තමේන්තුව

- නීති සම්පාදනය, අධීක්ෂණය හා මහජන මුදල් පාලනය උදෙසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය සපුරාලනු වස් ඔවුන් හට කාර්යක්ෂම සහ උසස් තත්වයේ සේවයක් ලබා දීම පිණිස වඩාත් සුදුසු සාමාජිකයින් කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම, උසස් කිරීම හා විනය සම්බන්ධ කටයුතු ඇතුළුව කාර්ය මණ්ඩලයේ සියලුම අංශ වල සාමාජිකයින්ගේ දැනුම, හැකියාවන් සහ ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් කළමණාකරණය, භාෂා ප්‍රවීණතා, පරිගණක, සූපවේදී, ගිණුම්කරණ, පුස්තකාල සේවා වැනි විෂයානුබද්ධ දේශීය සහ විදේශීය පුහුණු පාඨමාලා සංවිධානය කිරීම සහ කාර්ය මණ්ඩලයේ ධනාත්මක ආකල්ප වර්ධනය තුලින් ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස වැඩසටහන් සංවිධානය කිරීම සම්බන්ධ කටයුතු පරිපාලන දෙපාර්තමේන්තුවෙන් ඉටු කරනු ලැබේ.

- මීට අමතරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිය ධූරවල කටයුතු ඉටු කිරීම සඳහා අනුමත පහසුකම් හා සේවාවන් ගුණාත්මක භාවයෙන් සහ කඩිනමින් ලබා දීමට කටයුතු කිරීමත්, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ප්‍රවාහනය සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීමත් පරිපාලන දෙපාර්තමේන්තුව මඟින් කරනු ලබයි. පහත සඳහන් අංශ පරිපාලන දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා සිය දායකත්වය සපයයි :-

    1. ආයතන කාර්යාංශය

    2. මන්ත්‍රී සේවා කාර්යාංශය

    3. ප්‍රවාහන කාර්යාංශය.

## 3.3 හැන්සාඩ් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු රැස්වීම්, පාර්ලිමේන්තු කාරක සභා, සම්මන්ත්‍රණ, පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගම් සහ අන්තර් පාර්ලිමේන්තු සංගම් සම්මන්ත්‍රණ අපක්ෂපාතීව, නිවැරදිව හා කලට වේලාවට වාර්තා කිරීම, සුවිගත කිරීම සහ ශ්‍රව්‍ය වාර්තාකරණයන් අධීක්ෂණය සහතික කරයි.

## 3.4 සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව

- ජාතික වටිනාකමකින් යුත් සුවිශේෂී පොදු දේපළක් ලෙස පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සුරක්ෂිත කිරීම හා එය ඵලදායී සහ කාර්යක්ෂම ආකාරයෙන් නඩත්තු කිරීම හා

ආරක්ෂා කිරීම තහවුරු කිරීම සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

- භෞතික යටිතල පහසුකම් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ කාර්ය මණ්ඩලය සඳහා නවීන පහසුකම් සහිත කාර්යක්ෂම සේවා පරිසරයක් සැපයීම.

## 3.5 ආහාරපාන සහ ගෘහ පාලන දෙපාර්තමේන්තුව

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, කාර්ය මණ්ඩලය සහ අමුත්තන් සඳහා ආහාරපාන සැපයීම.
- ආපනශාලා සහ මුළුතැන්ගෙය කළමනාකරණය.
- ගොඩනැගිල්ලේ අභ්‍යන්තර හා බාහිර අලංකරණ කටයුතු, පවිත්‍රතා කටයුතු හා අනෙකුත් නඩත්තු කටයුතු .

## 3.6 මුදල් සහ සැපයුම් දෙපාර්තමේන්තුව

- පාර්ලිමේන්තුව සඳහා අයවැය සකස් කිරීම සහ වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් එකතු කිරීම හා අයවැය පාලනය; ගිණුම්කරණය සහ අවසන් ගිණුම් වාර්තා සකස් කිරීම;
- පාර්ලිමේන්තුවට අවශ්‍යකරන ද්‍රව්‍ය මිලදී ගැනීම, ගබඩාකිරීම, නිකුත් කිරීම හා ප්‍රසම්පාදන කටයුතු පරිපාලනය කිරීම;
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, විශ්‍රාමික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, කාර්ය මණ්ඩලයට සහ විශ්‍රාමිකයින්ට, අනියම් සහ සහන සේවකයිනට වැටුප් හා දීමනා ගෙවීම;
- සැපයුම් කරුවන්ට හා සේවා සපයන ආයතන වලට අදාල ගෙවීම් කිරීම.

මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ පහත සඳහන් අංශ ක්‍රියාත්මක වේ:-

1. මුදල් සහ ගිණුම් කාර්යාංශය
2. සැපයුම් හා සේවා කාර්යාංශය
3. ආහාරපාන ගිණුම් කාර්යාංශය

## 3.7 ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව

නීති සම්පාදනය, අධීක්ෂණය හා මහජන මුදල් යන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීමය සේවාවන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත සපයයි.
පහත සඳහන් අංශ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ:-

1. සභා ලේඛන කාර්යාංශය
2. පනත් කෙටුම්පත් කාර්යාංශය
3. කාරක සභා කාර්යාංශය - I
4. කාරක සභා කාර්යාංශය - II
5. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා සහ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභා කාර්යාංශය
6. මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශය
7. කථා පරිවර්තක කාර්යාලය
8. පුස්තකාලය.

## 3.8 තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව

තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම, අන්තර්ජාල සම්බන්ධතාවන් වැඩිදියුණු කිරීම, පාර්ලිමේන්තු අන්තඃජාලය කාර්යක්ෂම හා ඵලදායි ලෙස පවත්වාගෙන යාම සහ කළමනාකරණය, පාර්ලිමේන්තුවේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපකරණ නඩත්තුව මගින්;

- පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලයේ සියලු තොරතුරු තාක්ෂණ පාදක පරිපාලන ක්‍රියාකාරකම් ඉටු කිරීම.

## 3.9 විදේශ සබඳතා හා සන්ධාන කාර්යාංශය හා අභ්‍යන්තර විගණන අංශය සෘජුවම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

## 4. කාර්ය මණ්ඩල තොරතුරු

2016 වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව පහත දැක්වේ :-

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | | | | දැනට සිටින සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පා.ම.ලේ. | ගරු. කථානායකතුමා | ගරු. නියෝජ්‍ය කථානායකතුමා | ගරු.නි.කාරක සභාපතිතුමා | පා.ම.ලේ. | ගරු. කථානායකතුමා | ගරු. නියෝජ්‍ය කථානායකතුමා | ගරු.නි.කාරක සභාපතිතුමා |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 0 | 0 | 0 | 54 | 0 | 0 | 0 |
| තෘතීය මට්ටම | 162 | 0 | 0 | 0 | 142 | 0 | 0 | 0 |
| ද්විතීයික මට්ටම | 236 | 0 | 0 | 0 | 190 | 0 | 0 | 0 |
| ප්‍රාථමික මට්ටම | 474 | 0 | 0 | 0 | 440 | 0 | 0 | 0 |
| අනියම් / තාවකාලික | 03 | 45 | 21 | 21 | 02 | 45 | 21 | 17 |
| එකතුව (2016.12.31 දිනට) | 931 | 45 | 21 | 21 | 828 | 45 | 21 | 17 |

# 5. වාර්ෂික කාර්ය සාධනය

## 5.1 මූල්‍ය පරිපාලනය - 2016 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන වලින් කරන ලද වියදම් :-

2016 වර්ෂයේ මෙහෙයුම් වැඩසටහන් සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ලෙස වෙන්කරන ලද ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන වැය කළ ආකාරය පහත දැක්වේ :-

ඩී.පී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2016

වියදම් ශීර්ෂ අංකය: 16 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.පී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | **පුනරාවර්තන** | | | | | | | |
| 01 | ගරු කථානායකතුමාගේ කාර්යාලය | 111,850,000 | 73,000,000 | -5,000,000 | 179,850,000 | 158,491,725 | 21,358,275 | 5 |
| 02 | සාමාන්‍ය පරිපාලනය | 1,062,200,000 | 42,300,000 | 24,000,000 | 1,128,500,000 | 1,113,631,721 | 14,868,279 | 5 |
| 03 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පහසුකම් සැපයීම | 492,500,000 | 75,600,000 | -19,000,000 | 549,100,000 | 544,352,718 | 4,747,282 | 5 |
| | උප එකතුව (පුනරාවර්තන) | 1,666,550,000 | 190,900,000 | 0 | 1,857,450,000 | 1,816,476,164 | 40,973,836 | 4 |
| | **මූලධන** | | | | | | | |
| 01 | ගරු කථානායකතුමාගේ කාර්යාලය | 6,600,000 | 0 | 0 | 6,600,000 | 2,243,635 | 4,356,365 | 6 |
| 02 | සාමාන්‍ය පරිපාලනය | 518,200,000 | 54,393,000 | 0 | 572,593,000 | 333,138,846 | 239,454,154 | 7 |
| 03 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පහසුකම් සැපයීම | 800,000 | 0 | 0 | 800,000 | 688,088 | 111,912 | 8 |
| | උප එකතුව (මූලධන) | 525,600,000 | 54,393,000 | 0 | 579,993,000 | 336,070,569 | 243,922,431 | 4 |
| | මුළු එකතුව | 2,192,150,000 | 245,293,000 | 0 | 2,437,443,000 | 2,152,546,733 | 284,896,267 | 4 |

පිටු අංක. 02 සිට 32 දක්වා **ඩී.පී.එස්.ඒ 2** සිට **ඩී.පී.එස්.ඒ 10** දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක . 33 සිට 36 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
නම : ධම්මික දසනායක
තනතුර : පාර්ලිමේන්තුවේ මහ ලේකම්
දිනය:

ඩබ්ලිව්. බී. ඩී. දසනායක
පාර්ලිමේන්තුවේ මහ ලේකම්
පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ.

අධ්‍යක්ෂ ( මුදල් )
නම : කේ.පී.එම්. ජයශාන්ත
දිනය : 2017.03.24

කේ. පී. මර්වින් ජයශාන්ත
අධ්‍යක්ෂ (මුදල්)
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

ඩී.ජී.එස්.ඒ - 2

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම - 2016

වියදම් ශීර්ෂ අංකය: 16 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ඒ ආකෘති යොමුව සමඟ) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) | පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ. 3) | 1,666,550,000 | 190,900,000 | 0 | 1,857,450,000 | 1,816,476,164 | 40,973,836 | 5 |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ඒ. 4) | 525,600,000 | 54,393,000 | 0 | 579,993,000 | 336,070,569 | 243,922,431 | 6 - 8 |
| එකතුව | 2,192,150,000 | 245,293,000 | 0 | 2,437,443,000 | 2,152,546,733 | 284,896,267 | |

අධ්‍යක්ෂ( මුදල් )

දිනය:- 2017.03.24

ඩී.පී.එස්.ඒ - 2

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම - 2016

වියදම් ශීර්ෂ අංකය: 16
අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව
වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.පී.එස්.ඒ ආකෘති යොමුව සමඟ) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.පී.එස්.ඒ ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.පී.එස්.ඒ. 3) | 1,666,550,000 | 190,900,000 | 0 | 1,857,450,000 | 1,816,476,164 | 40,973,836 | 5 |
| (ආ) මූලධන (ඩී.පී.එස්.ඒ. 4) | 525,600,000 | 54,393,000 | 0 | 579,993,000 | 336,070,569 | 243,922,431 | 6 - 8 |
| එකතුව | 2,192,150,000 | 245,293,000 | 0 | 2,437,443,000 | 2,152,546,733 | 284,896,267 | |

(signature)
අධ්‍යක්ෂ( මුදල් )
දිනය:- 2017. 03. 24

5

බී.ජී.එස්.ඒ - 3

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපෘති අංකය. 01 ගරු කථානායකතුමාගේ කාර්යාලය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 51,800,000 | 7,000,000 | 0 | 58,800,000 | 57,679,929 | 1,120,071 |
| අනෙකුත් වියදම් | 60,050,000 | 66,000,000 | -5,000,000 | 121,050,000 | 100,811,796 | 20,238,204 |
| උප එකතුව | **111,850,000** | **73,000,000** | **-5,000,000** | **179,850,000** | **158,491,725** | **21,358,275** |
| ව්‍යාපෘති අංක 02 සාමාන්‍ය පරිපාලනය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 667,200,000 | 35,000,000 | | 702,200,000 | 695,316,196 | 6,883,804 |
| අනෙකුත් වියදම් | 395,000,000 | 7,300,000 | 24,000,000 | 426,300,000 | 418,315,525 | 7,984,475 |
| උප එකතුව | **1,062,200,000** | **42,300,000** | **24,000,000** | **1,128,500,000** | **1,113,631,721** | **14,868,279** |
| ව්‍යාපෘති අංක 03 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පහසුකම් සැපයීම. | | | | | | |
| පුද්ගල පඩිනඩි | 100,000,000 | | | 100,000,000 | 99,997,451 | 2,549 |
| අනෙකුත් වියදම් | 392,500,000 | 75,600,000 | -19,000,000 | 449,100,000 | 444,355,267 | 4,744,733 |
| උප එකතුව | **492,500,000** | **75,600,000** | **-19,000,000** | **549,100,000** | **544,352,718** | **4,747,282** |
| | | | | | | |
| මුළු එකතුව | 1,666,550,000 | 190,900,000 | 0 | **1,857,450,000** | **1,816,476,164** | **40,973,836** |

අධ්‍යක්ෂ( මුදල් )

දිනය:- 2017. 03. 24

ඩී.පී.එස්.ඒ - 4

# වයාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

වයාපෘති අංකය හා නාමය: 01 ගරු කථානායකතුමාගේ කාර්යාලය

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාශ්‍රය (සංකේත අංකය) | අයිතම විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම | 2,000,000 | 0 | 0 | 2,000,000 | 510,070 | 1,489,930 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 303,600 | 196,400 |
| 2003 | | 11 | වාහන | 3,000,000 | 0 | 0 | 3,000,000 | 725,940 | 2,274,060 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | | | | | | |
| 2101 | | 11 | වාහන | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 800,000 | 0 | 0 | 800,000 | 405,965 | 394,035 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300,000 | 0 | 0 | 300,000 | 298,060 | 1,940 |
| | | | එකතුව | 6,600,000 | 0 | 0 | 6,600,000 | 2,243,635 | 4,356,365 |

අධ්‍යක්ෂ( මුදල් )

දිනය:- 2017.03.24

7

ඩී.ජී.එස්.ඒ - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

ව්‍යාපෘති අංකය හා නාමය: 02 සාමාන්‍ය පරිපාලනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,000,000 | 0 | 0 | 1,000,000 | 472,998 | 527,002 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 9,000,000 | 0 | 0 | 9,000,000 | 8,924,050 | 75,950 |
| 2003 | | 11 | වාහන | 1,000,000 | 0 | 0 | 1,000,000 | 769,614 | 230,386 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | | | | | | |
| 2101 | | 11 | වාහන | 0 | 15,393,000 | 0 | 15,393,000 | 15,392,844 | 156 |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 5,000,000 | 2,000,000 | 0 | 7,000,000 | 6,553,207 | 446,793 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0 | 37,000,000 | 0 | 37,000,000 | 34,277,957 | 2,722,043 |
| | | | මානව සම්පත් සංවර්ධනය | | | | | | |
| 2401 | | 11 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 2,200,000 | 0 | 0 | 2,200,000 | 2,122,961 | 77,039 |
| 2001 | | 11 | පාර්ලිමේන්තු සංකීර්ණය නවීකරණය | | | | | | |
| | | | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000,000 | 0 | 0 | 500,000,000 | 264,625,215 | 235,374,785 |
| | | | එකතුව | 518,200,000 | 0 | 0 | 572,593,000 | 333,138,846 | 239,454,154 |

(signature)

අධ්‍යක්ෂ( මුදල් )

දිනය:- 2017. 03. 20

8

ඩී.ජී.එස්.ඒ - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

ව්‍යාපෘති අංකය හා නාමය: 03 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන් සඳහා පහසුකම් සැපයීම

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාකරණය (සංකේත අංකය) | අයිතම විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | | | | | | |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 300,000 | 0 | 0 | 300,000 | 198,214 | 101,786 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 489,874 | 10,126 |
| | | | එකතුව | **800,000** | **0** | 0 | **800,000** | **688,088** | **111,912** |

අධ්‍යක්ෂ (මුදල්)

දිනය:- 2017.03.24

**රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම :-**

2016 වර්ෂය අවසානයේදී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ අනුමත සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ:-

| | 2016 අනුමත සීමා (රු.) | 2016 තථ්‍ය අගයන් (රු.) | |
|---|---|---|---|
| වියදම්වල උපරිම සීමා | 38,000,000 | 01601-1 | 24,909,561.00 |
| | | 01601-2 | 1,271,958.00 |
| ලැබීම්වල අවම සීමා | 28,000,000 | 01601-1 | 31,162,838.63 |
| | | 01601-2 | 107,909.10 |
| උපරිම හර ශේෂය | 175,000,000 | 122,327,984.73 | |

# 6 ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව

## 6.1 ආංශික අධීක්ෂණ කාරක සභා

2015 දෙසැම්බර් 19 වන දින පාර්ලිමේන්තුවේ සම්මත වූ යෝජනාව අනුව ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය හඳුන්වා දුන් අතර නම් කරන ලද එකී කාරක සභා 16ක් යටතේ අමාත්‍යාංශ හා ආයතනවල කටයුතු අධීක්ෂණය කෙරේ. ඒ අනුව පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ වැඩි සහභාගීත්වයෙන් සභික මන්ත්‍රීවරු 20 දෙනෙකුගෙන් සමන්විත වන එම ආංශික අධීක්ෂණ කාරක සභා විසින්;

අ) තම විෂය පථය යටතේ ඇති විෂයයන් පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා ගැනීමටත් එක් එක් ආයතනයේ ඉලක්ක හා අරමුණු කෙසේ විය යුතු දැයි නිශ්චය කර ගැනීමටත් කමිටුව ක්‍රියා කරයි;

ආ) එක් එක් ආයතනයක් සඳහා වන ප්‍රධාන පාලන නීති වලට අමතරව, වෙනත් නීති රීති, රෙගුලාසි, ප්‍රඥප්ති සහ අධිකරණ තීන්දු වලින් තම ආයතනික ක්‍රියාකාරිත්වය හා කටයුතු වලට එල්ල කරන බලපෑම තීරණය කර ගැනීම සඳහා තම විෂය පථයට අයත් විෂයන්ට අදාළව ක්‍රියා කරයි;

ඇ) එක් එක් ආයතන තම විෂය පථය තුල සකසා ඇති සහ/හෝ ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගනී;

ඈ) අමාත්‍යවරයා විසින් ඉටුකළ කාර්යභාරයන් අධීක්ෂණයට ලක් කර, මෙම කාර්යභාරයන් ඉටු කිරීමේ දී මුහුණ දුන් අභියෝග හඳුනා ගනිමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) සහ 44 (2) ව්‍යවස්ථා වලට අනුව ඔවුන් වෙත පවරා ඇති කාර්යභාරයන් ක්‍රියාවට නැංවීමට අදාළව නිර්දේශ ලබා දෙයි;

ඉ) අභියෝග හා ගැටළු හඳුනා ගැනීම සඳහා තම විෂය පථයට/ ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රධාන නීතිරීති ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කරයි;

ඊ) ක්ෂේත්‍රයට අදාළ දැනට ක්‍රියාත්මක නීති, රෙගුලාසි, ව්‍යවස්ථා සහ අධිකරණ තීන්දු වලින් සමාජයට එල්ල කරන බලපෑම අනුව ඒවා අඛණ්ඩව ක්‍රියාවට නැංවීම, ලසු

කිරීම හෝ බැහැර කිරීම කමිටුව පරීක්ෂා කරන අතරම, ඒවා සංශෝධනය කිරීම සහ /හෝ නව නීති පැනවීමේ අවශ්‍යතාවය තීරණය කිරීම පිරික්සනු ලබයි;

උ) අමාත්‍යාංශය විසින් නව නීති හා රෙගුලාසි ක්‍රියාවට නැංවීම මනාව අධීක්ෂණය කර, ඒවා සංශෝධන කිරීමේ සහ හෝ නව නීති පැනවීමේ අවශ්‍යතාවය තීරණය කරයි;

ඌ) මීට අමතරව, අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ඇතැම් ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘතිවල අදාළත්වය, ඵලදායිත්වය, විනිවිදභාවය හා කාර්යක්ෂමතාවය තීරණය කිරීම හා පරීක්ෂා කරයි.

උක්ත ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා තම විෂය පථයට අයත් විෂයන් පිළිබඳ ලිඛිත තොරතුරු/ ලේඛන ඉල්ලා සිටීමටත්, නිතිපතා රැස්වීම් සංවිධානය කිරීමටත්, නිළධාරීන් කැඳවා ප්‍රශ්න කිරීමටත්, අදාළ අමාත්‍යවරයා(වරුන්) ගෙන් ප්‍රශ්න කිරීමටත්, ප්‍රවීනයන්ගේ හා මහජන අදහස් විමසීමටත් සහ ක්ෂේත්‍ර චාරිකා සිදු කිරීමටත් ආංශික කාරක සභාවන්ට හැකි අතර ස්වාධීන පර්යේෂණ, විග්‍රහයන් සිදු කිරීම හා අවශ්‍ය පරිදි කොමිසම් පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීමේ හැකියාවද ඇත.

ආංශික අධීක්ෂණ කාරක සභා විසින් සිදු කරනු ලබන විශේෂිත ක්‍රියාමාර්ග යටතේ ආයතන වල ක්‍රියාකාරිත්වය පරීක්ෂාවට ලක් කර, ඒවා තම වැඩසටහන් හා මෙහෙයුම් සුදුසු මට්ටමකින් විනිවිදබවින් යුක්තව, සක්‍රියව හා කාර්යක්ෂමව සිදුවනවා දැයි ප්‍රමාණවත් ලෙස අධීක්ෂණය කරන අතර ආයතනවල කාර්යභාරයන්, වගකීම්, අරමුණු සහ පරමාර්ථ වලට යෝග්‍යතාවය තීරණය කිරීමත් ආයතනවල පාලන ව්‍යුහය හා ඒවායේ සක්‍රිය දායකත්වය පරීක්ෂා කිරීම සිදු කෙරේ.

එසේම සැළසුම් සැකසීමේදී හා ක්‍රියාවට නැංවීමේදී වෙනත් කාරක සභාවල අදහස් ලබා ගනිමින් තම අධික්ෂණ සැලසුම් කාලීනව සංශෝධනය කිරීම ද ආංශික අධීක්ෂණ කාරක සභා සතුය.

ඒ අනුව එක් එක් කාරක සභාව විසින් 2016 වර්ෂය තුළදී ගන්නා ලද ක්‍රියා මාර්ග පහත සඳහන් පරිදි සංක්ෂිප්තව දක්වනු ලැබේ:-

| | ආංශික අධීක්ෂණ කාරක සභාව | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | සළකා බැලීම් සංඛ්‍යාව | | | | පාර්ලිමේන්තුව වෙත පිළිගන්වන ලද වාර්තා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | | පනත් කෙටුම්පත් | නියමයන්/ නියෝග | යෝජනා | වාර්ෂික හා කාර්ය සාධන වාර්තා / ගිණුම් | |
| 01 | ආර්ථික සංවර්ධනය පිළිබඳ | 8 | 1 | - | - | 3 | 1 |
| 02 | ජාත්‍යන්තර සබඳතා පිළිබඳ | 11 | 1 | 4 | - | 3 | 5 |
| 03 | ජාතික ආරක්ෂාව පිළබඳ | 6 | 1 | - | - | 5 | 2 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| 04 | තිරසර සංවර්ධන සහ පරිසර හා ස්වභාවික සම්පත් පිළිබඳ | 12 | 1 | 11 | - | 1 | 3 |
| 05 | කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ | 8 | - | - | - | - | - |
| 06 | අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ<br><br>අනු කමිටු | 14 | 4 | 8 | - | - | 4 |
| | • උසස් අධ්‍යාපනය පිළිබඳ | 4 | පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් සැකසීම | | | | |
| | • අධ්‍යාපනය පිළිබඳ | 3 | | | | | |
| 07 | සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ | 11 | 2 | 2 | - | - | 3 |
| 08 | ප්‍රවාහන හා සන්නිවේදන පිළිබඳ | 12 | | | | | |
| 09 | කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ<br><br>අනු කමිටු | 8 | - | 1 | - | 2 | 1 |
| | • කෘෂිකර්ම ප්‍රතිපත්ති පිළිබඳ | 3 | | | | | |
| 10 | නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ | 14 | 5 | 1 | 3 | - | 8 |
| 11 | තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ | 8 | - | 1 | - | - | 1 |
| 12 | ව්‍යාපාර සහ වානිජ කටයුතු පිළිබඳ | 7 | - | 1 | - | 1 | 2 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 13 | බලශක්ති පිළිබඳ<br><br>අනු කමිටු | 13 | - | 2 | - | 6 | 3 |
| | • විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති පිළිබඳ | 6 | | | | | |
| 14 | නිශ්පාදන සහ සේවා පිළිබඳ<br><br>අනු කමිටු<br>• සිමෙන්ති නිශ්පාදනය සම්බන්ධ රාජ්‍ය ආයතන වැඩි දියුණු කිරීම සඳහා වන | 7 | - | - | - | - | - |
| 15 | අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ | 11 | 1 | - | - | 2 | 1 |
| 16 | ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැගීම පිළිබඳ | 9 | - | - | - | 2 | 1 |

## 6.2 විශේෂ කාර්යයන් සඳහා වූ කාරක සභා :

### (i) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව

2015 දෙසැම්බර් 19 වන දින පාර්ලිමේන්තුවේ සම්මත වූ යෝජනාව අනුව ආංශික අධීක්ෂණ කාරක සභාව හඳුන්වා දුන් අතර

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව යටතේ ආදායම් රැස් කිරීමත්;
- ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කිරීමත්;
- නිශ්චිත නීතිමය අවශ්‍යතාවයන් සඳහා රජයේ අරමුදල් උපයෝජනයත්;
- රජයේ අරමුදල් යෙදවීමත්;
- පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනතේ අන්තර්ගත විසර්ජන අවපාතයන්, විසර්ජන පැවරුම් හා අනපේක්ෂිත ශේෂයත්;
- පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීමත්;
- රාජ්‍ය ණය හා ණය සේවාකරණය සහ 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ වාර්තා හා ප්‍රකාශනත් පරීක්ෂා කිරීමත් කාරක සභාවේ කාර්යභාරය වේ.

තවද ඉහත යොමුගත කරුණුවලින් ඉස්මතුවන කරුණු කාරක සභාව විසින් කලින් කලට පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමත්, අයවැය ඇස්තමේන්තු සභාගත කිරීමෙන් සති 06 ක් ඇතුළත, රජයේ ප්‍රතිපත්තිමය සීමා ඇතුළත මුදල් නිසි පරිදි යොදවා ඇත්තේ ද යන්න ඇතුළත් ඇස්තමේන්තු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමත් අයවැය ඉදිරිපත් කොට විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමෙන් දින 04 ක් ඇතුළත, කාරක සභාව විසින් සමස්ත ඇස්තමේන්තුගත වැය හා ලැබීම් ගණනය සඳහා පදනම් වශයෙන් භාවිතා කරන ලද රාජ්‍ය මූල්‍ය, මූල්‍ය හා ආර්ථික උපකල්පනයන් පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුව හමුවේ තැබීමත් කාරක සභාවේ වගකීම වේ.

ඒ අනුව සභික මන්ත්‍රීන් 20 දෙනෙකුගෙන් සමන්විත රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා වන අතර 2016 වර්ෂය තුළදී සභාවාර 28ක් පවත්වා කාරක සභාවේ වාර්තා 8ක් සභාගත කර ඇත.

### (ii) තේරීම් කාරක සභාව

කථානායක ගරු කරු ජයසූරිය මහතාගේ සභාපතිත්වයෙන් යුත් මෙම කාරක සභාවේ සභික මන්ත්‍රීන් සංඛ්‍යාව 20ක් වන අතර 2016 වර්ෂය තුළදී සභාවාර 08ක් පවත්වා ඇත.

### (iii) වරප්‍රසාද පිළිබඳ කාරක සභාව

ගරු තිලක් මාරපන මහතාගේ සභාපතිත්වයෙන් යුත් මෙම කාරක සභාවේ සභික මන්ත්‍රීන් සංඛ්‍යාව 10ක් වන අතර 2016 වර්ෂය තුළදී සභාවාර 4ක් පවත්වා ඇත.

### (iv) උසස් නිලතල පිළිබඳ කාරක සභාව

කථානායක ගරු කරු ජයසූරිය මහතාගේ සභාපතිත්වයෙන් යුත් මෙම කාරක සභාවේ සභික මන්ත්‍රීන් සංඛ්‍යාව 15ක් වන අතර 2016 වර්ෂය තුළදී සභාවාර 14ක් පවත්වා ඇත.

(v) **ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව**

කථානායක ගරු කරු ජයසූරිය මහතාගේ සභාපතිත්වයෙන් යුත් මෙම කාරක සභාවේ සභික මන්ත්‍රීන් සංඛ්‍යාව 9 ක් වන අතර 2016 වර්ෂය තුළදී සභාවාර 8ක් පවත්වා ඇත.

(vi) රාජ්‍ය ගිණුම් කාරක සභාව:

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව 2016 වර්ෂය තුල **ආයතන 67**ක් කාරක සභාව හමුවට කැඳවා විමර්ශන 74 ක්ද විශේෂිත කරුණු පිළිබඳව විමර්ශන 3 ක් ද පවත්වා රාජ්‍ය ආයතනයන්හි කාර්ය සාධනය මෙන්ම මූල්‍ය පාලනය ක්‍රමවත් කිරීමට දැඩි අවධානයක් යොමුකර ඇත.

**<u>2016 වර්ෂයේ ගිණුම් කාරක සභාව විසින් ආරම්භ කළ විශේෂිත /නව වැඩ සටහන්</u>**

විශේෂයෙන්ම, කාරක සභාව විසින් සලකා බලනු ලබන විගණකාධිපති වාර්තා වලට පමණක් සීමා නොවී රජයේ ආයතනවල ආදායම් උපනතීන් පිළිබඳව අධ්‍යයනයකර පරිගණක තොරතුරු තාක්ෂණය ක්‍රමවේදයක් හඳුන්වාදීම තුලින් මාර්ග ගත ක්‍රමයට රජයේ සියලුම ආයතන වල තොරතුරු ලබාගැනීම හා ඒ ආශ්‍රයෙන් ආයතන ඇගයීමකට ලක් කර, දැනට එම ආයතන තුල පවතින පරිපාලන හා මූල්‍ය දුර්වලතාවයන් හඳුනාගනිමින් ඒවා ක්‍රමවත් කිරීම සඳහා පිළියම් යෙදීමත්, එමගින් කාරක සභාවේ කටයුතු තවදුරටත් ක්‍රමවත් කිරීමත් මෙම වර්ෂය තුලදී කාරක සභාව විසින් සිදුකර ඇති කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.

<u>ගිණුම් කාරක සභාව මෙහෙය වූ දැනුවත් කිරීමේ වැඩමුළු</u>

මාර්ග ගත ක්‍රමයට තොරතුරු ලබාගැනිමේ වැඩසටහන පිලිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු කිපයක් පැවැත්වීමට කාරක සභාව විසින් කටයුතු කරන ලදි. ඒ අනුව සියලුම අමාත්‍යංශ ලේකම්වරු සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන කොමසාරිස්වරු/සහකාර කොමසාරිස්වරු ඇතුලු ප්‍රධානීන්, සඳහා පිළිවෙලින් 2016.03.31 සහ 2016.12.06 දෙදින විශේෂ වැඩමුළු දෙකක් පැවැත්විය.

**<u>අනු කාරකසභා පත් කිරීම</u>**

රජයේ, ප්‍රධාන ආදායම් උපදවන ආයතන වල ආදායම් එකතු කිරීම, ක්‍රමවත් කිරීම හා වැඩි දියුණු කිරිම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම සම්බන්ධව යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අනු කාරකසභාවක් පත් කර ඇත.

**කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2016.01.01 සිට 2016.04.07 දක්වා විමර්ශනයට භාජනය කරන ලද ආයතන ඇතුලත් ප්‍රධාන වාර්තාවක් 2016.09.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර රජයේ ආදායම් එකතු කිරීම වැඩි දියුණු කිරිම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් පත්කළ අනුකමිටු වාර්තාව 2016.11.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

**2016 වර්ෂයතුලදී, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතන.**

| අංක | ආයතනයේ නම | විමර්ශනය කල දිනයන් |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා රේගුව | 09.01.2016<br>23.03.2016<br>23.06.2016 |
| 02 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 09.01.2016<br>24.03.2016<br>10.06.2016<br>06.10.2016 |
| 03 | දේශීය ආදායම් දොපාර්තමේන්තුව | 26.01.2016 |
| 04 | සුරාබදු දෙපාර්තමේන්තුව | 26.01.2016 |
| 05 | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 26.01.2016 |
| 06 | අධ්‍යාපන අමත්‍යාංශය | 27.01.2016 12.02.2016 |
| 07 | ඉඩම් අමාත්‍යාංශය | 27.02.2016 |
| 08 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 28.01.2016 |
| 09 | විභාග දෙපාර්තමේන්තුව | 28.01.2016 |
| 10 | තක්සේරු දෙපාර්තමේන්තුව | 09.02.2016 |
| 11 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 10.02.2016 |
| 12 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | 11.02.2016 |
| 13 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-කුරුණෑගල | 12.02.2016 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-මහනුවර | 23.02.2016 |
| 15 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 24.02.2016 |
| 16 | දුම්රිය දෙපාර්තමේන්තුව | 25.02.2016 |
| 17 | සේවක අර්ථ සාධක අරමුදල | 26.02.2016 |
| 18 | තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යාංශය | 08.03.2016 |
| 19 | තිරසර සංවර්ධන හා වනජීවි දෙපාර්තමේන්තුව | 08.03.2016 |
| 20 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 08.03.2016 |
| 21 | ජාතික උද්භිධ උද්‍යාන දෙපාර්තමේන්තුව | 08.03.2016 |

| | | |
|---|---|---|
| 22 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 10.03.2016 |
| 23 | ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | 10.03.2016 |
| 24 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 10.03.2016 |
| 25 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 10.03.2016 |
| 26 | ජාතික සහජීවන සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 10.03.2016 |
| 27 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 10.03.2016 |
| 28 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 10.03.2016 |
| 29 | වාණිජ දෙපාර්තමේන්තුව | 10.03.2016 |
| 30 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 10.03.2016 |
| 31 | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | 11.03.2016 |
| 32 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 11.03.2016 |
| 33 | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය | 07.04.2016 |
| 34 | කම්කරු දෙපාර්තමේන්තුව | 07.04.2016 |
| 35 | මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 07.04.2016 |
| 36 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 07.04.2016 |
| 37 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 07.04.2016 |
| 38 | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | 07.04.2016 |
| 39 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 04.05.2016 |
| 40 | රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව | 05.05.2016 |
| 41 | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව | 06.05.2016 |
| 42 | ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 18.05.2016 |
| 43 | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 08.06.2016 |
| 44 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 08.06.2016 |
| 45 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 22.06.2016 |
| 46 | පොලිස් දෙපාර්තමේන්තුව | 22.06.2016 |
| 47 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 24.06.2016 |
| 48 | ශ්‍රී ලංකා යුධ හමුදාව | 24.06.2016 |
| 49 | ජාතික අධ්‍යාපන කොමිසම | 08.07.2016 |
| 50 | රාජ්‍ය සේවා කොමිසම | 08.07.2016 |
| 51 | නීතිපති දෙපාර්තමේන්තුව (විමර්ශනයට ලක් නොවිය) | 20.07.2016 |

| | | |
|---|---|---|
| 52 | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම් අමාත්‍යාංශය | 20.07.2016 |
| 53 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 21.07.2016 |
| 54 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 21.07.2016 |
| 55 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 10.08.2016 |
| 56 | බස්නාහිර පළාත් සභාව | 11.08.2016<br>25.102016 |
| 57 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 22.09.2016 |
| 58 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 22.09.2016 |
| 59 | සබරගමුව පලාත් සභාව | 04.10.2016 |
| 60 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- හම්බන්තොට | 05.10.2016 |
| 61 | වත්තල ප්‍රාදේශීය සභාව | 25.10.2016 |
| 62 | මීරිගම ප්‍රාදේශීය සභාව | 25.10.2016 |
| 63 | දෙහිවල ගල්කිස්ස මහනගර සභාව | 26.10.2016 |
| 64 | පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය ආමත්‍යාංශය | 26.10.2016 |
| 65 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-මාතර | 27.10.2016 |
| 66 | වයඹ පළාත් සභාව | 27.10.2016 |
| 67 | කළුතර නගර සභාව | 28.10.2016 |

**කාරක සභාව විසින් විශේෂිත වූ කරුනු විමර්ශනය කිරීම සඳහා පවත්වන ලද විශේෂ කාරක සභා රැස්වීම්**

| **අංක** | **විමර්ශනයට ලක් වූ කරුණු** | **විමර්ශනය කල දිනයන්** |
|---|---|---|
| 01 | ඵලදායි තොරතුරු තාක්ෂණික පද්ධතීන් උපයෝගි කරගනිමින් රජයේ ආදායම් එකතුකිරීම, වැඩිදියුණුකිරීම සඳහා පාර්ශ්වකරුවන් විසින් සහ පාර්ශ්වකරුවන් අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම **(අනු කාරක සභාව මගින් විමර්ශනය කරන ලදි)** | 04.05.2016<br>02.05.2016<br>08.07.2016<br>09.08.2016<br>23.08.2016 |
| 02 | ලේඛණ ගතනොවූ ණය සහ 2015 ජනවාරි මස සිදුකල බැඳුම්කර නිකුතුව හේතු කොට ගෙන රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට හානියක්/පාඩුවක් සිදුවී තිබේදැයි යන්න විමර්ශනය කිරීම සඳහා කැඳවන ලද විශේෂ කාරක සභාව | 07.06.2016 |
| 03 | ගණකාධිකාරී සේවාවේ පවතින පුරප්පාඩු පිරවීමට අදාළව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පවත්වන ලද විශේෂ කාරක සභාව | 09.06.2016<br>27.10.2016 |

### (vii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව :

2016 වර්ෂය තුලදී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පහත සඳහන් ආයතනවල කාර්ය සාධනය සහ වර්තමාන කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා කාරක සභා රැස්වීම් පවත්වා වාර්තා සකස් කිරීමේ කටයුතුවල නිරත විය.

**කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

එයට අමතරව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් එයට පැවරුනු වැඩකටයුතු සාර්ථක ලෙස නිමකර කාරක සභාව විමර්ශනය කරන ලද ආයතන සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳව වූ වාර්තා 02ක් 2016 අගෝස්තු මස 09 දින සහ 2016 ඔක්තෝබර් මස 28 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

**කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතන**

| අංක | ආයතනයේ නම | විමර්ශනය කල දිනය |
|---|---|---|
| 01 | ලංකා බැංකුව | 2016.01.26 |
| 02 | ලංකා විදුලිබල මණ්ඩලය | 2016.01.28 |
| 03 | එල්. ටී. එල්. හෝල්ඩින්ස් පුද්ගලික සමාගම | 2016.02.09 |
| 04 | රක්නා ආරක්ෂන ලංකා සමාගම | 2016.02.09 |
| 05 | ශ්‍රී ජයවර්ධනපුර රෝහල් භාරකාර මණ්ඩලය | 2016.02.10 |
| 06 | වැඩිහිටියන් සඳහා වූ ජාතික සභාව | 2016.02.12 |
| 07 | ශ්‍රී ලංකා ගුවන් සේවය | 2016.02.12 |
| 08 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 2016.02.23 |
| 09 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 2016.02.24 |
| 10 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2016.02.25 |
| 11 | කෘෂිකර්ම හා කෘෂි රක්ෂණ මණ්ඩලය | 2016.02.26 |
| 12 | රක්නා ආරක්ෂණ ලංකා සමාගම | 2016.03.08 |
| 13 | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය | 2016.03.08 |
| 14 | තල් සංවර්ධන මණ්ඩලය | 2016.03.11 |
| 15 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | 2016.03.23 |
| 16 | ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව | 2016.03.23 |
| 17 | ලංකා විදුලිබල මණ්ඩලය | 2016.03.24 |
| 18 | ජාතික චිත්‍රපට සංස්ථාව | 2016.03.24 |
| 19 | ඇල්කඩුව වැවිලි සමාගම | 2016.04.06 |
| 20 | ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය | 2016.04.07 |
| 21 | ලංකා ඛනිජ තෙල් සංස්ථාව | 2016.04.08 |
| 22 | සමුපකාර තොග වෙළඳ සංස්ථාව | 2016.05.18 |
| 23 | මාර්ග සංවර්ධන අධිකාරිය | 2016.06.07 |
| 24 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2016.06.08 |
| 25 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 2016.06.08 |
| 26 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 2016.06.09 |
| 27 | විදුලි සංදේශ නියාමන කොමිසම | 2016.06.23 |
| 28 | බැඳුම්කර නිකුතුව සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වාර්තාව ගැන කරන ලද කම්ටු සාකච්ඡාව | 2016.06.29 |
| 29 | බැඳුම්කර නිකුතුව ගැන විගණකාධිපතිගේ ඉදිරිපත් කිරීම | 2016.07.05 |
| 30 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2016.07.07 |
| 31 | මාර්ග සංවර්ධන අධිකාරිය | 2016.07.08 |
| 32 | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය | 2016.07.20 |
| 33 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 2016.07.21 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 2016.07.22 |
| 35 | ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය | 2016.08.09 |
| 36 | මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඇති මගනැගුම සමාගම් | 2016.08.10 |
| 37 | ආර්යුවේද ඖෂධ සංස්ථාව | 2016.08.10 |
| 38 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2016.08.12 |
| 39 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2016.08.23 |
| 40 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2016.08.23 |

| | | |
|---|---|---|
| 41 | සීමාසහිත කුරුණෑගල වතු සමාගම | 2016.08.25 |
| 42 | සේවක අර්ථසාධක අරමුදල | 2016.08.26 |
| 43 | ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව | 2016.09.06 |
| 44 | සංචාරක සංවර්ධන අධිකාරිය | 2016.09.07 |
| 45 | ශ්‍රීලංකාමහබැංකුව | 2016.09.08 |
| 46 | සංචාරක සංවර්ධන අධිකාරිය | 2016.09.09 |
| 47 | සී/ස ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 2016.09.09 |
| 48 | සමුපකාර තොග වෙළඳ සංස්ථාව/ලක් සතොස | 2016.09.20 |
| 49 | මධ්‍යම පරිසර අධිකාරිය | 2016.09.21 |
| 50 | මහජන බැංකුව | 2016.09.22 |
| 51 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2016.09.23 |
| 52 | ආර්යුවේදඖෂධසංස්ථාව | 2016.10.04 |
| 53 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2016.10.05 |
| 54 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2016.10.20 |
| 55 | ශ්‍රීලංකා මහ බැංකුව | 2016.10.21 |
| 56 | ශ්‍රී ලංකා මහබැංකුව | 2016.10.24 |
| 57 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2016.10.26 |
| 58 | විශේෂ සාකච්ඡාව | 2016.11.21 |
| 59 | ජාතික ලොතරැයි මණ්ඩලය | 2016.12.05 |
| 60 | ආර්යුවේද ඖෂධ සංස්ථාව | 2016.12.07 |

### (VIII) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව :

2016 වසර සඳහා කාරක සභාවේ පළමු රැස්වීම 2016.02.25 දින පවත්වා ඇති අතර එම වර්ෂය තුළ රැස්වීම් වාර 31 ක් පවත්වා පෙත්සම් 300 ක් සලකා පෙත්සම් ගොනු 77 ක් අවසන් කර ඇත. මෙම පෙත්සම් ගොනු 77 තුළ සහන ලබා ගත් පෙත්සම්කරුවන් 18 දෙනෙක් සිටින අතර ඉතිරි පෙත්සම්කරුවන් සඳහා සහන ලබා දීමට කාරක සභාවට ප්‍රතිපාදන නොමැති බැවින් එම ගොනු අවසන් කර ඇත.

| | |
|---|---|
| 2016 වර්ෂය තුළ කාරක සභා කාර්යාංශයට ලැබී ඇති මුළු පෙත්සම් ගණන | 1238 |
| ස්ථාවර නියෝග වලට අනුකූල නොවීම මත කාරක සභා කාර්යාංශය විසින් භාර නොගත් පෙත්සම් ගණන | 329 |
| ඉදිරි කටයුතු සඳහා කාරක සභා කාර්යාංශය විසින් භාර ගත් පෙත්සම් ගණන | 909 |

| | | |
|---|---|---|
| 2016 වර්ෂයේ දී කථානායකතුමාගේ අනුමැතියට යොමු කර ඇති පෙත්සම් ගණන | | 918 |
| 2015 වසරේ ලැබී ඇති පෙත්සම් ගණන | 50 | |
| 2016 වසරේ ලැබී ඇති පෙත්සම් ගණන | 868 | |

| | |
|---|---|
| 2016 වර්ෂය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති පෙත්සම් ගණන (2015 වර්ෂයේදී ලැබී එම වර්ෂය තුළ ඉදිරිපත් නොවී ඉතිරිව තිබූ පෙත්සම්ද 2016 වසරේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි) | 954 |
| විමර්ශන කටයුතු සඳහා ඔම්බුඩ්ස්මන්තුමා වෙත යොමු කර ඇති පෙත්සම් ගණන | 110 |

## 6.3 විශේෂ කාරක සභා:

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ සභාපතිත්වයෙන් යුත් මෙම කාරක සභාවේ සභික මන්ත්‍රීන් සංඛ්‍යාව 21ක් වන අතර 2016 වර්ෂය තුළදී සභාවාර 46ක් පවත්වා ඇත.

(ii) තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව

නියෝජ්‍ය කථානායක ගරු තිලංග සුමතිපාල මහතාගේ සභාපතිත්වයෙන් යුත් මෙම කාරක සභාවේ සභික මන්ත්‍රීන් සංඛ්‍යාව 15ක් වන අතර 2016 වර්ෂය තුළදී එක් සභාවාරයක් පවත්වා ඇත.

**තත්කාර්ය කාරක සභා**

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය**

ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මියගේ සභාපතිත්වයෙන් යුත් මෙම කාරක සභාවේ සභික මන්ත්‍රීන් සංඛ්‍යාව 13ක් වන අතර 2016 වර්ෂය තුළදී සභාවාර 10ක් පවත්වා ඇත.

**ළමුන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය**

ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ සභාපතිත්වයෙන් යුත් මෙම කාරක සභාවේ ක්‍රියාකාරී කමිටු සාමාජිකත්වය 7ක් වන අතර 2016 වර්ෂය තුළදී සභාවාර 2ක් පවත්වා ඇත.

## 6.4 පනත් කෙටුම්පත් කාර්යාංශය :

පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ප්‍රමුඛතම ව්‍යවස්ථාදායක කාර්යභාරය වන නීති සම්පාදනයට අදාළ ක්‍රියාපටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුව ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම පනත් කෙටුම්පත් කාර්යංශයේ මෙහෙවරයි.

ඒ යටතේ පනත් කෙටුම්පත් කාර්යංශය විසින් රජයේ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ සිට එම පනත් සඳහා කථානායකවරයාගේ සහතිකය ලබා ගැනීමෙන් අනතුරුව මුද්‍රණය කිරීම දක්වා සපුරාලිය යුතු වන සියලුම ව්‍යවස්ථාදායකමය පියවරයන්ට අදාළ කටයුතු භාෂාත්‍රයෙන්ම ඉටු කරනු ලබන්නේය.

එසේම පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ගැසට් මුද්‍රණයේ සිට එම පනත් මුද්‍රණය තෙක් කටයුතු ද ඒ අයුරින්ම භෂාත්‍රයෙන්ම ඉටු කරනු ලබයි.

2016 වර්ෂය තුළ දී මෙම කාර්යංශය වෙත ලැබුණු රජයේ පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව 30 කි. පනත් කෙටුම්පත් ලෙස මුද්‍රණය කිරීමෙන් අනතුරුව ඉන් 24 ක් පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලද අතර එම පනත් 24 හිම ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කරන ලදී

**2016 වර්ෂයේදී සම්මත වූ පනත් කෙටුම්පත්**

| අංකය | පනත් අංකය | පනත් නාමය | සහතිකය සටහන් කල දිනය |
|---|---|---|---|
| 1 | 1/2016 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)<br>உள்ளூர் அதிகாரசபைகள் தேர்தல்கள் (திருத்தம்)<br>Local Authorities Elections (Amendments) | 2016-02-17 |
| 2 | 2/2016 | ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)<br>கடற்றொழில், நீர்வாழ் உயிரின வளங்கள் (திருத்தம்)<br>Fisheries and Aquatic Resources (Amendment) | 2016-02-17 |
| 3 | 3/2016 | සේවකයන්ගේ ජාතික අවම වේතනය<br>வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம்<br>National Minimum Wage of Workers | 2016-03-23 |
| 4 | 4/2016 | සේවකයන්ගේ අයවැය සහන දීමනාව<br>வேலையாளர்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி<br>Budgetary Relief Allowance of Workers | 2016-03-23 |
| 5 | 5/2016 | කාලාවරෝධ (විශේෂ විධිවිධාන)<br>காலவிதிப்பு (விசேட ஏற்பாடுகள்)<br>Prescription (Special Provisions) | 2016-04-26 |
| 6 | 6/2016 | ක්ෂුද්‍රමූල්‍ය<br>நுண்நிதியளிப்பு<br>Microfinance | 2016-05-20 |
| 7 | 7/2016 | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ)<br>ஆசிய உட்கட்டமைப்பு முதலீட்டு வங்கி உடன்படிக்கை (ஏற்புறுதி)<br>Asian Infrastructure Investment Bank Agreement(Ratification) | 2016-05-30 |
| 8 | 8/2016 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන)<br>ஆட்களைப் பதிவு செய்தல் (திருத்தம்)<br>Registration of Persons (Amendment) | 2016-07-07 |
| 9 | 9/2016 | සමථ මණ්ඩල (සංශෝධන)<br>மத்தியஸ்த சபை (திருத்தம்)<br>Mediation Board (Amendment) | 2016-07-21 |
| 10 | 10/2016 | හෝමියෝපති<br>ஓமியோபதி<br>Homoeopathy | 2016-07-27 |
| 11 | 11/2016 | ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව<br>இலங்கை தேசிய ஆராய்ச்சி பேரவை<br>National Research Council of Sri Lanka | 2016-07-27 |

| | | | |
|---|---|---|---|
| 12 | 12/2016 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ<br>தகவலுக்கான உரிமை<br>Right to Information | 2016-08-04 |
| 13 | 13/2016 | මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන)<br>நிதி முகாமைத்துவம் (பொறுப்பு) (திருத்தம்)<br>Fiscal Management (Responsibility) (amendment) | 2016-08-23 |
| 14 | 14/2016 | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍යය ඉටුකිරීම)<br>காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் (தாபித்தலும், நிருவகித்தலும், பணிகளை நிறைவேற்றுதலும்)<br>Office on Missing Persons (Establishment, Administration, and Discharge of Functions) | 2016-08-23 |
| 15 | 15/2016 | සත්ව ආහාර (සංශෝධන)<br>விலங்குத் தீனி (திருத்தம்)<br>Animal Feed (Amendment) | 2016-09-07 |
| 16 | 16/2016 | මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන)<br>இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்)<br>Registration of Deaths (Temporary Provisions) (Amendment) | 2016-09-07 |
| 17 | 17/2016 | විශ්වවිද්‍යාල (සංශෝධන)<br>பல்கலைக்கழகங்கள் (திருத்தம்)<br>Universities (Amendment) | 2016-10-05 |
| 18 | 18/2016 | අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත<br>Code of Criminal Procedure (Amendment) | 2016-10-17 |
| 19 | 19/2016 | නීති කොමිෂන් සභා (සංශෝධන)<br>சட்ட ஆணைக்குழு (திருத்தம்)<br>Law Commission (Amendment) | 2016-10-17 |
| 20 | 20/2016 | එකතු කළ අගය මත බදු (සංශෝධන)<br>சேர்பெறுமதி வரி (திருத்தம்)<br>Value Added Tax (Amendment) | 2016-11-01 |
| 21 | 21/2016 | වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන)<br>துறைமுக, விமான நிலைய அபிவிருத்தி அறவீடு (திருத்தம்)<br>Ports and Airport Development Levy (Amendment) | 2016-11-07 |
| 22 | 22/2016 | ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)<br>நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) Nation Building Tax (Amendment) | 2016-11-07 |
| 23 | 23/2016 | විසර්ජන (සංශෝධන)<br>ஒதுக்கீடு (திருத்தம்)<br>Appropriation (Amendment) | 2016-11-07 |
| 24 | 24/2016 | විසර්ජන<br>ஒதுக்கீடு<br>Appropriation | 2016-12-10 |

එම වර්ෂය තුළ දී පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ගැසට් 55 ක් මුද්‍රණ කිරීමට කටයුතු කරන ලදී. තවද පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් 57 ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලද අතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද එම සියලු පනත් කෙටුම්පත් අවශ්‍ය කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශ වෙත යොමු කරන ලදී. මෙම පනත් කෙටුම්පත් වලින් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් 5ක් පිලිබඳව ගරු අමාත්‍යතුමන්ලාගෙන් ලබාගත් වාර්තා 5ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

2016 වර්ෂය තුළ රජයේ පනත් කෙටුම්පත් හා සම්බන්ධ ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීම් 22 ක් පවත්වා ඇති අතර එම කාරක සභා රැස්වීම් සඳහා පනත් කෙටුම්පත් කාර්යංශයේ නිලධාරීන් සහභාගී වී අවශ්‍ය දායකත්වය ලබා දී ඇත.

මෙයට අමතරව,

(අ) සබරගමුව සංචාරක ප්‍රඥප්තිය සම්බන්ධයෙන් සබරගමුව පලාත් සභාව විසින් පාර්ලිමේන්තුවේ අදහස් විමසන ලද අතර ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අදහස් ලබාගෙන සබරගමුව පලාත් සභාව වෙත යැවීමට කටයුතු කිරීම සහ

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.ඒ.සුමන්තිරන් මහතා විසින් ඉදිරිපත් කළ ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමගාමී ලැයිස්තුවට අදාළ වූ බැවින් ඒ පිළිබඳව සියලු පලාත් සභා නිරීක්ෂණ ලබාගෙන පාර්ලිමේන්තුවට වාර්තා කිරීමෙන් අනතුරුව පලාත් සභාවල අදහස් අදාළ අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු කිරීම ද පනත් කෙටුම්පත් කාර්යාංශය මඟින් 2016 වර්ෂය තුළදී සිදු කරන ලදී.

## 6.5 සභා ලේඛන කාර්යාංශය :

2016 වර්ෂය තුලදී සභා ලේඛන කාර්යාංශය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී:-

(අ) පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත යෝජනා සහ ප්‍රශ්න ඇතුළත් න්‍යාය පුස්තක 04ක් හා ඒ හා සම්බන්ධ පරිපූරක 28ක් ද, පාර්ලිමේන්තුවේ රැස්වීම් 97ක් වෙනුවෙන් න්‍යාය පත්‍ර සහ කාර්ය සටහන්ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සකස් කර මුද්‍රණය කිරීම.

(ආ) අමාත්‍යාංශ, ඒවා යටතට ගැනෙන දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළව ඒ ඒ අමාත්‍යාංශවලින් යොමු කරන ලද කාර්ය සාධන සහ වාර්ෂික වාර්තා 398ක් ද,විවිධ පනත් යටතේ සකස් කර ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග, රෙගුලාසි සහ නියමයන් අඩංගු යෝජනාද, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් භාර දෙන ලද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 736 ක් ලියාපදිංචි කරන ලදුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව සංස්කරණයකර, සිංහල, දෙමළහා ඉංග්‍රීසි භාෂා වලට පරිවර්තනය කර න්‍යාය පුස්තකවලට හෝ අදාළ පරිදි න්‍යාය පුස්තක පරිපූරකවලටඇතුළත්කිරීමට කටයුතු කිරීම.

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේපෞද්ගලික මන්ත්‍රී යෝජනා 18 ක් සහ දින නියමයක් නොමැති යෝජනා 03 ක් භාරගෙන සංස්කරණය කර, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කරන ලදුවන්‍යායපුස්තකවලට හෝ අදාළ පරිදි න්‍යාය පුස්තක පරිපූරකවලටඇතුළත් කිරීමට කටයුතු කිරීම.

(ඉ) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම් 39 ක් කැඳවා, ඒ පිළිබඳ කාර්ය සටහන් භාෂාත්‍රයෙන්ම නිකුත් කිරීමට කටයුතු කිරීම සහ එකී තීරණවලට අදාළ පසුවිපරම් කටයුතු කිරීම.

(ඊ) 2016 වර්ෂයට අදාළව ශෝක ප්‍රකාශ යෝජනා09ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර ඊට අදාළ හැන්සාඩ් වාර්තාව, උදෘත, කැඳවීම් ලිපි, රැස්වීම් න්‍යායපත්‍ර අභාවප්‍රාප්ත මන්ත්‍රීවරයාගේ කලත්‍රයාට හෝ සමීප ඥාතීන්ට යැවීමට කටයුතු කිරීම.

## 6.6 පාර්ලිමේන්තු කථා පරිවර්තක කාර්යාලය :

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පාර්ලිමේන්තු කථා පරිවර්තක කාර්යාලයෙන් සපයන ලද සේවාවන් පහත පරිදි වේ :-

(අ) පාර්ලිමේන්තු රැස්වීම් දිනවලදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සභා ගර්භය තුළ සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවෙන් සමගාමී කථා පරිවර්තන සේවාවන් සැපයීම.

(ආ) ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීම්වලදී සහ කාරක සභා කාමරවල පවත්වන ලද වෙනත් රැස්වීම්වලදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රජයේ නිළධාරීන් සහ කාරක සභාවලට සහභාගීවන විවිධ නිළධාරීන් සඳහා සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවෙන් සමගාමී කථා පරිවර්තන සේවාවන් සැපයීම.

(ඇ) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම්, පෙත්සම් පිළිබඳ කාරක සභා රැස්වීම් සහ සමගාමී කථා පරිවර්තන පහසුකම් නොමැති කාරක සභා කාමරවල පවත්වන ලද රැස්වීම්වලදී දෙමළ භාෂාව කථාකරන මන්ත්‍රීවරුන්ට සමීපස්ථ කථා පරිවර්තන සේවාවන් සැපයීම.

ඉකුත් වසර සමඟ සසඳන විට 2016 වර්ෂයේ කාරක සභා කථාපරිවර්තන කටයුතු හා භාෂා පරිවර්තන කටයුතු සැළකිය යුතු අයුරින් වැඩි වී ඇති බව සඳහන් කළ යුතුව ඇත.

| අංශය | පරිවර්තන පිටු සංඛ්‍යාව |
|---|---|
| සිංහල/ඉංග්‍රීසි | 1964 |
| සිංහල/දෙමළ | 1369 |
| දෙමළ/ඉංග්‍රීසි | 948 |

## 6.7 පාර්ලිමේන්තු පුස්තකාලය :

පාර්ලිමේන්තු පුස්තකාලය සතු වටිනා ඉපැරණි සම්පත් සංඛ්‍යාංකරණය කිරීම සඳහා අවශ්‍ය වන මූලික අංගය වන සංඛ්‍යාංක පුස්තකාල බිහි දොර (Digital library portal) ස්ථාපිත කරන ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන් පුස්තකාලයේ සියළු දත්ත පදනම් DSPACE මෘදුකාංගය මගින් Digital පුස්තකාලයට ඇතුළත් කරන ලදී.

පසුගිය වසරේ දී පුස්තකාලයේ ප්‍රධාන එකතුවට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනටම අදාළ ප්‍රකාශන අත්පත් කරගන්නා ලදී. ඒ පහත දැක්වෙන පරිදිය.

පොත් - 874

පුවත්පත් - 34

වාර සඟරා - 16

එසේම ප්‍රවීන ගත් කතුවරියක විසින් තම කෘති 360 ක් ගරු කථානායකතුමා මගින් පුස්තකාලයට පරිත්‍යාග කළාය.

පුස්තකාලය විසින් පොත් සහ අනෙකුත් ප්‍රලේඛන 1124 ක් නිකුත් කර ඇත.

2016 වසරේදී ජාතික වැදගත්කමකින් යුත් විවිධ විෂයයන්ට අදාළ හදිසි තොරතුරු අවශ්‍යතා මතුවූ අවස්ථාවල විවිධ විමර්ශන ග්‍රන්ථ, පුවත්පත්,සඟරා හා අන්තර්ජාලය ආදී විවිධ තොරතුරු මූලාශ්‍ර භාවිතා කරමින් ඉතාමත් කෙටි කාලයක් තුළ තොරතුරු ගොනු 475 ක් පමණ සපයා ඇත.

පසුගිය වසර තුළදී මන්ත්‍රීවරුන්ගේ ක්ෂණික විමර්ශන සඳහා දිනපතා පළවන ජාතික පුවත්පත් හා වාරසඟරා වලින් කාලීන වැදගත්කමකින් යුත් විවිධ ප්‍රවෘත්ති සහ ලිපි 2500 කට අධික සංඛ්‍යාවක් ඡායා පිටපත්කරණය හා පරිලෝකණය (Scan) මගින් සපයා ඇත.

එසේම හැන්සාර්ඩ් වාර්තා, පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා, පනත් කෙටුම්පත්, පනත් ආදී පාර්ලිමේන්තු ප්‍රකාශන වලින් ද ගැසට් පත්‍ර, අමාත්‍යාංශ ප්‍රගති වාර්තා, සංස්ථා, මණ්ඩල හා විවිධ ආයතන මගින් නිකුත් කරන ලද ප්‍රගති වාර්තා සහ වාර්ෂික වාර්තා ආදියේ මුද්‍රිත පිටපත් වලින් මෙන්ම ඉලෙක්ට්‍රොනික පිටපත් වලින්ද අවශ්‍ය තොරතුරු ලබා ගෙන සකස් කරන ලද ප්‍රලේඛණ සහ වාර්තා 80 ක් පමණ සපයා ඇත.

පුස්තකාලයේ පර්යේෂණ අංශය විසින් පසුගිය වසර තුළ පහත දැක්වෙන කාර්යයන් සපුරා ඇත;

| | |
|---|---|
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් | -254 |
| කථානායක තුමා / මහ ලේකම් කාර්යාලයේ කටයුතු සහ පාර්ලිමේන්තු නියොජිත කණ්ඩායම් විදේශ සමුළු වලට සහභාගිවීමේදී අවශ්‍ය වන කථා සකස් කිරීම් | - 64 |
| පනත් කෙටුම්පත් සඳහා පසුබිම් වාර්තා | - 28 |
| තාක්ෂණික වාර්තා | - 10 |
| පර්යේෂණ පත්‍රිකා | - 08 |

## 7 වේත්‍රධාරී දෙපාර්තමේන්තුව :

පාර්ලිමේන්තු ක්‍රියාදාමය සපුරාලීමට අවශ්‍ය පහසුකම් සළසනු පිණිස ගරු කථානායකතුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ඔවුනගේ කාර්ය මණ්ඩල, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සහ අනුබද්ධිත කාර්ය මණ්ඩල යන අංශවලට සේවා සැපයීම මෙම දෙපාර්තමේන්තුවේ අරමුණ වේ.

- <u>ආරක්ෂක කටයුතු</u>

ආරක්ෂක තත්ත්වය උපරිම තලයක පවත්වා ගනිමින් යම් යම් ආරක්ෂක විධිවිධාන ලිහිල් කිරීමට 2016 වසරේ දී ද, හැකි වූ අතර ඒ සම්බන්ධිත තීරණ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සහ කාර්ය මණ්ඩලය ද, රාජ්‍ය නිලධාරීන් ද, දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, ගරු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය ද, රාජකාරි කටයුතු සඳහා පැමිණෙන රාජ්‍ය නිලධාරීන් ද, පමණක් නොව පාර්ලිමේන්තු නැරඹීම පිණිස පැමිණෙන මහජනතාවට ද, පහසුව සැලසුනි.

- <u>නිල හැඳුනුම් පත් නිකුත් කිරීම</u>

ගරු මන්ත්‍රීවරුන්, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය, අනුබද්ධිත කාර්ය මණ්ඩලය, පොලිසිය හා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත නිල හැඳුනුම් පත් 700 ක් නිකුත් කර ඇත.

- <u>පාර්ලිමේන්තු ගොඩනැගිල්ල තුලට පුද්ගලයින් පැමිණීම පාලනය කිරීම සහ ප්‍රවේශ කළමනාකරණ කටයුතු විධිමත් පරිදි ඉටුකිරීම, ප්‍රවේශ පාලන පද්ධතිය සහ පිළිගැනීම් අංශයන්හි ක්‍රියාකාරීත්වය</u>

වෙත්‍රධාරී/ නියෝජ්‍ය වෙත්‍රධාරී/ සහකාර වෙත්‍රධාරී/ වෙත්‍රධාරී දෙපාර්තමේන්තු කාර්යාලය/ ප්‍රවේශ පාලන මැදිරිය යන කාර්යාල සමඟ පිළිගැනීමේ කවුන්ටර හා ආරක්ෂක කවුන්ටර ජාල ගත වන ආකාරයට, විවිධ අවසර පත් නිකුත් කිරීමේ පහසුකම් ද සහිතව ප්‍රවේශ පාලන පද්ධතිය වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධිත සැලසුම් පිළියෙල කිරීම පිණිස අදාල මූලික තොරතුරු, තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ අනුව, සකස් කරන ලද වැඩසටහන සම්බන්ධව අදාල කාර්ය මණ්ඩල සඳහා දැනුවත් කිරීමේ මූලික පුහුණු කටයුතු 2016 වසරේ දී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

- <u>කාර්ය මණ්ඩලයේ පැමිණීම/ පිටවීම පිළිබඳ තොරතුරු නිරීක්ෂණය හා වාර්තා කිරීම</u>

2012 වසරේ ඔක්තෝම්බර් මාසයේ සිට ආරම්භ කරන ලද, කැමරා පද්ධතියක් මගින් කාර්ය මණ්ඩලයේ පැමිණීම/ පිටවීම සම්බන්ධිත වැඩිදුර නිරීක්ෂණය හා ආයතන කාර්යාංශය වෙත වාර්තා කිරීමේ කාර්යය 2016 වසර තුළ ද, සිදු කළ අතර ඉදිරිපත් කළ වාර්තා ප්‍රමාණය 900ක් පමණ විය.

- <u>නිල ශෝක ප්‍රකාශ කටයුතු ඉටු කිරීම</u>

ගරු කථානායකතුමා/පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාගේ උපදෙස් පරිදි නිල ශෝක ප්‍රකාශ සිදු කළ අවස්ථා 105 ක් පමණ විය.

- <u>පාර්ලිමේන්තු අවුරුදු උත්සවය</u>

ගරු කථානායකතුමාගේ උපදෙස් පරිදි ගරු පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය, අනුබද්ධිත කාර්ය මණ්ඩල හා පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2016 වර්ෂයේදී "පාර්ලිමේන්තු අවුරුදු උළෙළ" 2016.04.09 දින කොළඹ 07, ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩා පිටියේදී ඉතා සාර්ථකව පැවැත්වීමට හැකිවිය.

මෙම දෙපාර්තමේන්තුව මඟින් 2016 වර්ෂයේදී ඉටු කරන ලද කාර්යයන් විස්තරාත්මකව පහත දැක්වේ;

- විශේෂ අමුත්තන්ගේ පැමිණීම (VIP Visits)
  2016 වර්ෂය තුලදී විශේෂ අමුත්තන්ගේ පැමිණීම දළ වශයෙන් 650 ක් පමණ විය.

- මන්ත්‍රීවරුන්ගේ රියදුරන් වෙනුවෙන් වාහන අවසරපත් 58 ක් නිකුත් කොට ඇත.

- පුවත්පත් වාර්තාකරුවන් හා පුවත්පත් පණිවිඩකරුවන් වෙනුවෙන් පිළිවෙලින් අවසරපත් 167 කා 20 ක් නිකුත් කොට ඇත.

- පාර්ලිමේන්තුව නැරඹීම පිණිස අවසරපත් නිකුත් කිරීම. (දළ වශයෙන්)

  (i) 2016 වසර තුල නිකුත් කළ මුළු ගැලරි අවසරපත් සංඛ්‍යාව - 6200

  (ii) පාර්ලිමේන්තුව නැරඹීම සඳහා (කණ්ඩායමකට එක බැගින්) නිකුත් කළ අවසරපත් (Group Passes) - 3160

  (iii) කණ්ඩායම් වශයෙන් පැමිණි පාසැල් සිසු සිසුවියන් ගණන - 210,095

  (iv) නිකුත් කරන ලද තාවකාලික මාසික අවසරපත් සංඛ්‍යාව - 2124

  (v) පූර්ව අවසරයකින් තොරව පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණි පාසැල් සිසුන් හා අනෙකුත් පුද්ගලයන්ගේ සංඛ්‍යාව - 9105

- **පාර්ලිමේන්තුව අවට කලාපය තුළ ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් ආරක්ෂක නිරවුල් සහතික ලබා දීම.**

  නිවාස සංවර්ධනය හා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පාර්ලිමේන්තුවේ ආරක්ෂක නිරවුල් සහතිකය ලබා ගැනීම පිණිස යොමු වී ඇති අයදුම්පත් හා අනුමැතිය ලබාදී ඇති විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව | 157 |
| අනුමැතිය ලබා දී ඇති අයදුම්පත් සංඛ්‍යාව | 135 |

## 8 පරිපාලන දෙපාර්තමේන්තුව :

### 8.1 ආයතන කාර්යාංශය:-

**2016 වසර තුලදී ආයතන කාර්යාංශය විසින් පහත සඳහන් කාර්යයයන් සාර්ථකව ඉටු කර ඇත.**

#### 8.1.1 <u>පුහුණු වැඩසටහන්</u>

**(අ) දේශීය පුහුණු වැඩසටහන් / පාඨමාලාවන් / දැනුවත් කිරීමේ වැඩසටහන්**

පහත සඳහන් ආයතන මඟින් (බාහිරව) සහ පාර්ලිමේන්තුව තුලද ආසන්න වශයෙන් කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් 400 සඳහා පුහුණු වැඩසටහන් / පාඨමාලාවන් සංවිධානය කරන ලදී.

- නිපුනතා සංවර්ධන පදනම
- ප්‍රාග් ආයතනය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
- තරුණය සංසදය
- ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය
- ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අධ්‍යාපන ආයතනය
- සී/ස ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
- රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන්
- ධනාත්මක චින්තනය පිළිබඳ පුහුණු වැඩසටහන
- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

**(ආ) විදේශීය පුහුණු වැඩසටහන් / අධ්‍යයන වැඩසටහන් / සම්මන්ත්‍රණ**

- ITEC පුහුණු වැඩසටහන් - ඉන්දියාව - නිලධාරීන් 11
- විදේශ පාර්ලිමේන්තු නිලධාරීන් සඳහා ඉන්දියානු පාර්ලිමේන්තුවේ පැවැත් වූ 32 වැනි පුහුණු වැඩසටහන - ඉන්දියාව - නිලධාරීන් 7
- කෙටුම්පත්කරණය පිළිබඳ විදේශ නිලධාරීන් සඳහා ඉන්දියානු පාර්ලිමේන්තුවේ පැවැත් වූ 32 වැනි පුහුණු වැඩසටහන - ඉන්දියාව - නිලධාරීන් 2
- මාලදිවයිනේ ව්‍යවස්ථාදායක සභාව සංවිධානය කළ හුරුකරවීමේ වැඩසටහන - මාලදිවයින - නිලධාරීන් 9
- ආසියානු කලාපීය රාජ්‍ය ගිණුම් කාරකසභා නිලධාරීන් සඳහා වූ රැස්වීම - භූතානය - නිලධාරීන් 1
- පාර්ලිමේන්තු පර්යේෂණ කේන්ද්‍රවල කලාපීය රැස්වීම - ජෝර්දානය- නිලධාරීන් 3
- ඉන්දියාවේ ලොක් සභා අධ්‍යයන චාරිකාව - ඉන්දියාව - නිලධාරීන් 5
- ආසියානු හා නැඟෙනහිර ආසියානු කලාපවල පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල සංවර්ධන වැඩමුළුව - පකිස්තානය - නිලධාරීන් 2
- ලෝක විද්‍යුත්-පාර්ලිමේන්තු සම්මන්ත්‍රණය - චිලී - නිලධාරීන් 1
- පාර්ලිමේන්තු පුස්තකාල හා පර්යේෂණ පිළිබඳ අන්තර්ජාතික පුස්තකාල සංගමයේ වාර්ෂික සම්මන්ත්‍රණය - ඇමෙරිකා එක්සත් ජනපදය - නිලධාරීන් 2
- ආසියානු පාර්ලිමේන්තු සභාවේ කාර්ය මණ්ඩල හා මූල්‍ය රෙගුලාසි පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීම සහ 1වැනි විධායක සභා රැස්වීම - කාම්බෝජියාව - නිලධාරීන් 1
- 65වන වෙස්ට්මිනිස්ටර් සම්මන්ත්‍රණය- එක්සත් රාජධානිය- නිලධාරීන් 1
- ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුව - එක්සත් රාජධානිය - නිලධාරීන් 2
- ඔස්ට්‍රියානු පාර්ලිමේන්තුවේ අධ්‍යයන චාරිකාව - ඔස්ට්‍රියාව - නිලධාරීන් 1

- පාර්ලිමේන්තු සභාගැබේ ශබ්ද පද්ධතිය සවි කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන - සිංගප්පූරුව - නිලධාරීන් 5

#### 8.1.2 ආයතනික කාර්යයන්

**බඳවා ගැනීම් -** පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා නව සේවකයින් 66 දෙනෙකු බඳවා ගන්නා ලදී.

**රක්ෂණ ක්‍රමය -** ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග ක්‍රියාත්මක කරන කාර්ය මණ්ඩල රක්ෂණය සඳහා 2016 වර්ෂයේදී වැය කළ මුදල රු. 4,384,280.42 කි.

### 8.2 මන්ත්‍රී සේවා කාර්යාංශය:-

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිය මන්ත්‍රී ධූරයන්හි කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය අනුමත කරන ලද පහසුකම් සහ සේවාවන් නිසි පරිදි හා කලට වේලාවට ඔවුන් වෙත ලබාදීමට කටයුතු කිරීම සහ පාර්ලිමේන්තුවේ අදාළ අංශ මඟින් ද, බාහිර අංශ මගින් ද ඒවා යථා පරිදි සැපයෙන බවට වග බලාගැනීම මෙම අංශයේ ප්‍රධාන රාජකාරිය වේ.

2016 වසර තුළදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවශ්‍යතාවය අනුව නව රාජකාරී දුරකථන පහසුකම් ලබාදීම, ඔවුනට අවශ්‍ය ලිපිද්‍රව්‍ය නියමිත ප්‍රමාණයන්ගෙන් සැපයීම, පුද්ගලික ආරක්ෂාව සඳහා ගිනි අවි නිකුත් කිරීමට අදාළ ව ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම, ගරු කථානායකතුමාගේ නිල නිවසේ නඩත්තු කටයුතු හා නුවර එළිය "සෙන්පති නිවස" නිවාඩු නිකේතනයේ පරිපාලන කටයුතු මෙම කාර්යාංශය මගින් සිදුකරන අතර නඩත්තු කටයුතු සම්බන්ධීකරණය ද සිදු කෙරේ. මාදිවෙල මන්ත්‍රී නිවාසවල නඩත්තු කටයුතු සම්බන්ධීකරණය හා පාලනය කිරීම ද මෙම කාර්යාංශය මගින් සිදුකරනු ලැබේ.

ලංකා විදුලිබල මණ්ඩලය සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ වාර්ෂිකව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පෝරම නියමිත වේලාවට ලබාදී ඔවුන් දැනුවත් කිරීම ද මන්ත්‍රී සේවා කාර්යාංශය මගින් සිදුකෙරේ.

### 8.3 ප්‍රවාහන කාර්යාංශය :-

**පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සහ අනුබද්ධ කාර්ය මණ්ඩල වලට ප්‍රවාහන පහසුකම් සැපයිම, වාහන නඩත්තුව හා අලුත් වැඩියා කටයුතු මෙම කාර්යාංශය මඟින් ඉටු කෙරේ.**

## 9 හැන්සාඩ් දෙපාර්තමේන්තුව :

2016 වර්ෂය තුළදී හැන්සාඩ් දෙපාර්තමේන්තුව ඉටු කළ කාර්ය භාරය පහත පරිදි වේ.

- පාර්ලිමේන්තු රැස්වීම් දින 97 ක් ආවරණය කිරීම.

- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE), රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (PAC), උසස් නිලතල පිළිබඳ කාරක සභාව, වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, කාන්තා සංසදය, ළමා සංසදය, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, උපදේශක කාරක සභා (විශේෂ), ස්ථාවර කාරක සභා සහ අයවැය ඇස්තමේන්තු පිළිබඳ කාරක සභාව ඇතුළුව කාරක සභා 326 ආවරණය කිරීම.
- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම් ආවරණය කිරීම.
- අසංශෝධිත හැන්සාඩ් වාර්තා 71 ක සෝදුපත් කියවීම. ( කාණ්ඩ 239-244)
- සංශෝධිත හැන්සාඩ් වාර්තා අවසාන මුද්‍රණය සඳහා යැවීම. ( කාණ්ඩ 238-240)
- හැන්සාඩ් වාර්තා කාණ්ඩ 06ක් පොත් ලෙස බැඳීම සඳහා මුද්‍රණාලය වෙත යැවීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරු **7දෙනෙකු පි**ළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා අඩංගු හැන්සාඩ් වාර්තා මුද්‍රණය සඳහා යැවීම.
- කාරක සභා 235 ක වාර්තා සටහන් සංස්කරණය කිරීම.
- හැන්සාඩ් වාර්තා 69කට අදාළ වන සුචි 6ක් සැකසීම සහ මුද්‍රණය සඳහා යැවීම. ( කාණ්ඩ 239-244)
- පාර්ලිමේන්තු ගර්භය තුළ හා කාරක සභා තුළ සිදුවන ක්‍රියාදාමයන් පිළිබඳ හඬ පටිගත කිරීම.
- පාර්ලිමේන්තු ක්‍රියාදාමයන් පිළිබඳ CD තැටි නිකුත් කිරීම සඳහා අදාළ වන අනුමැතිය ලබා දීම.
- සම්මුඛ පරීක්ෂණ මණ්ඩල, ටෙන්ඩර් මණ්ඩල, තාක්ෂණික ඇගයීම් කමිටු සහ අනෙකුත් කමිටුවලට හැන්සාඩ් සංස්කාරක සහ නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරකවරුන්ගේ සේවය ලබා දීම

## 10 සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව :

2016 වර්ෂය තුල මෙම දෙපාර්තමේන්තුව මඟින් පහත සඳහන් කාර්යයන් සාර්ථකව නිම කර ඇත.

- රු. 121,733,358.65 ක වියදමක් දරා පාර්ලිමේන්තු සභාගර්භය තුල ස්ථාපිත ශබ්ද පරිපාලන පද්ධතිය සපයා සවි කර ක්‍රියාත්මකකිරීම හා සාර්ථකව නිම කිරීම.
- රු. 237,000,000.00 ක වියදමින් පාර්ලිමේන්තු සභාගර්භය තුල සංවෘත රූපවාහිනී කැමරා පද්ධතිය සපයා සවි කර ක්‍රියාත්මකකිරීම හා සාර්ථකව නිම කිරීම.

- රු. 8,771,827.89 ක වටිනාකමින් යුත් ඔරලෝසු පද්ධතිය පාර්ලිමේන්තුව තුල ස්ථාපිත කිරීම
- රු. 14,375,000.00 ක වියදමක් දරා පාර්ලිමේන්තුව තුල අභ්‍යන්තර දුරකථන පද්ධතිය ස්ථාපිත කිරීම හා සාර්ථකව නිම කිරීම
- කාරක සභා කාර්යාංශය හා සැපයුම් හා සේවා කාර්යාංශය වායු සමීකරණය කිරීම හා සාර්ථකව නිම කිරීම
- වෛද්‍ය මධ්‍යස්ථානය වායු සමීකරණය කිරීම හා සාර්ථකව නිම කිරීම

## 11 තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව :

2016 වර්ෂයේදී තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්අතර තොරතුරු සහ සන්නිවේදන යටිතල ව්‍යුහය නඩත්තු කිරීම, ආයතනයේ විවිධ අංශ වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය කළමනාකරණ, පොදු ව්‍යාපාර සහ රාජ්‍ය ගිණුම් කාරක සභා සඳහා තොරතුරු කළමනාකරණ, භෝජනාගාර කළමනාකරණ, සකසුරුවම් සමිතියේ කළමනාකරණය, අමුත්තන්ගේ පැමිණිමේ තොරතුරු කළමනාකරණය සඳහා පද්ධතීන් ඇති කිරීම,ගෘහස්ථ යෙදුම් වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම, නඩත්තු සේවා ගිවිසුම් පිළිබඳව කටයුතු කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, පාර්ලිමේන්තු වෙබ් අඩවිය නඩත්තු කිරීම, තොරතුරු ආපදා කළමනාකරණය පද්ධති අධීක්ෂණය කිරීම යනාදී කටයුතු ප්‍රධාන ස්ථානයක් ගෙන ඇත.

## 12 අභ්‍යන්තර විගණන කාර්යාංශය :

(අ) පාර්ලිමේන්තුවේ මානව සම්පත් සහ අනෙකුත් පොදු සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම දිරිමත් කිරීම තුලින් ආයතනික අරමුණු ඉටු කරගැනීම පිණිස පිහිටුවන ලද විගණන සහ කළමණාකරන කමිටුවේ රැස්වීම් 04 ක් පවත්වා එම කමිටු වල වාර්තා මහා භාණ්ඩාගාරයට යොමු කර ඇත.

(ආ) පාර්ලිමේන්තුව පිහිටි ඉඩම් වල මිනුම් සහ ඔප්පු වල නිරවුල් භාවය පිළිබඳ කටයුතු කර ඇත.

(ඇ) මුදල් හා ගිණුම් කාර්යාංශය, සැපයුම් හා සේවා කාර්යාංශය, ආහාර පාන දෙපාර්තමේන්තුව, සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව, තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව යන අංශ වල කටයුතු පිළිබඳව විමර්ශනය කර කළමණාකරණයට වාර්තා කිරීම.

(ඈ) වවුචර් පත් පූර්ව විගණනය කිරීම ක්‍රමානුකූලව සිදුකර ඇත.

## 13 විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය :

2016 වර්ෂයේදී විදේශ සම්බන්ධතා හා සන්ධාන කාර්යාංශය විසින් ප්‍රධාන වශයෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ සාර්ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය යන සංගම්වලට අදාළ සියලුම කාර්යයන් සහ සේවාවන් ඉටු කරන ලදී.


මෙහිදී පහත දැක්වෙන සමුළු, වැඩමුළු, සංචාර, රැස්වීම්, අධ්‍යයන චාරිකා යනාදියට අදාළ සියලුම කටයුතු සංවිධානය කරන ලදී.

| වැඩ මුළුව/ සමුළුව/රැස්වීම | පැවැත්වූ රට | පැවැත්වූ කාල සීමාව |
|---|---|---|
| 23 වෙනි පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව | මැලේසියාව | 2016 ජනවාරි 09 සිට 14 දක්වා |
| එක්සත් රාජධානියේ ආසියානු කලාපීය වැඩමුළුව | ඉන්දියාව | 2016 ජනවාරි 18 සිට 21 දක්වා |
| ආසියානු කලාපීය මහජන ගිණුම් කාරක සභාවේ රැස්වීම | නේපාලය | 2016 මාර්තු 10 සිට 14 දක්වා |
| ආසියානු කලාපීය වැඩමුළුව (පාර්ලිමේන්තුවේ සාමාජිකයන්ගේ මූලික අයිතිවාසිකම් රැකගැනීම සම්බන්ධව ) | ශ්‍රී ලංකාව | 2016 ජනවාරි 31 සිට පෙබරවාරි 04 දක්වා |
| ජාත්‍යන්තර පාර්ලිමේන්තු සමුළුව | එක්සත් රාජධානිය | 2016 මාර්තු 14 සිට 17 දක්වා |
| මධ්‍ය වාර්ෂික විධායක කමිටු රැස්වීම | එක්සත් රාජධානිය | 2016 අප්‍රේල් 27 සිට 30 දක්වා |
| 13 වෙනි කැනේඩියානු පාර්ලිමේන්තු සැසිවාරය | කැනඩාව | 2016 මැයි 29 සිට ජූනි 03 දක්වා |
| 27 වෙනි පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සැසිවාරය | ඕස්ට්‍රේලියාව | 2016 ජූනි 05 සිට 11 දක්වා |
| 6 වෙනි වෙස්මිනිස්ටර් වැඩමුළුව | එක්සත් රාජධානිය | 2016 ජූලි 04 සිට 07 දක්වා |
| ආසියා පැසිපික් කලාපීය වැඩමුළුව | ඕස්ට්‍රේලියාව | 2016 ජූලි 25 සිට 28 දක්වා |
| 8 වෙනි පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ පාර්ලිමේන්තු සමුළුව | කැනඩාව | 2016 නොවැම්බර් 06 සිට 10 දක්වා |
| 65 වෙනි වෙස්මිනිස්ටර් වැඩමුළුව | එක්සත් රාජධානිය | 2016 නොවැම්බර් 21 සිට 25 දක්වා |
| 62 වෙනි පොදු රාජ්‍ය මණ්ඩලීය සම්මේලනය | එක්සත් රාජධානිය | 2016 දෙසැම්බර් 11 සිට 17 දක්වා |
| දකුණු ආසියානු කලාපීය කතානායකවරුන්ගේ තිරසාර සංවර්ධනය පිළිබඳ සම්මේලනය | බංග්ලාදේශය | 2016 ජනවාරි 30 සිට 31 දක්වා |
| 134 වෙනි අන්තර් පාර්ලිමේන්තු සමුළුව | සැම්බියාව | 2016 මාර්තු 17 සිට 23 දක්වා |
| අන්තර් පාර්ලිමේන්තු සංගමයේ තරුණ පාර්ලිමේන්තු නියෝජිතයන් සම්බන්ධයෙන් වූ ගෝලීය සමුළුව | සැම්බියාව | 2016 මාර්තු 16 සිට 17 දක්වා |
| ආසියානු පාර්ලිමේන්තු සංගමයේ සමාජ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීම | ඉරානය | 2016 අප්‍රේල් 25 සිට 29 දක්වා |
| ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ වැඩමුළුව | සිංගප්පූරුව | 2016 මැයි 17 සිට 19 දක්වා |
| ආසියානු පාර්ලිමේන්තු සංගමයේ දේශපාලන කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීම | ජෝර්දානය | 2016 ජූනි 01 සිට 02 දක්වා |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා - චීන පාර්ලිමේන්තු මිත්‍රත්ව සම්මේලනයේ අධ්‍යයන සංචාරය | චීනය | 2016 ජූනි 10 සිට 19 දක්වා |
| ආසියානු පාර්ලිමේන්තු සංගමයේ ආර්ථික හා තිරසාර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීම | පකිස්ථානය | 2016 ජූලි 25 සිට 28 දක්වා |
| තිරසාර සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | ඉන්දුනීසියාව | 2016 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 01 දක්ව |
| ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ අධ්‍යයන චාරිකාව | චීනය | 2016 සැප්තැම්බර් 12 සිට 20 දක්වා |
| ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අමාත්‍යවරුන්ගේ වැඩමුළුව | චීනය | 2016 සැප්තැම්බර් 21 සිට 29 දක්වා |
| කාර්ය මණ්ඩල, මූල්‍ය රෙගුලාසි පිළිබඳ පළමුවැනි විධායක සභා ස්ථාවර කමිටු රැස්වීම | කාම්බෝජය | 2016 සැප්තැම්බර් 25 සිට 28 දක්වා |
| ශ්‍රී ලංකා - පලස්තීන පාර්ලිමේන්තු මිත්‍ර සංගමයේ නියෝජිතයන්ගේ සංචාරය | පලස්තීනය | 2016 ඔක්තෝම්බර් 10 සිට 15 දක්වා |
| ගරු කතානායකතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ නිල සංචාරය | චීනය | 2016 ඔක්තෝම්බර් 09 සිට 15 දක්වා |
| 135 වෙනි අන්තර් පාර්ලිමේන්තු සමුළුව | ස්විට්සර්ලන්තය | 2016 ඔක්තෝම්බර් 21 සිට 28 දක්වා |
| ස්විට්සර්ලන්ත ජාතික කවුන්සිලයේ කතානායකතුමාගේ සහ පාර්ලිමේන්තු මහ ලේකම්තුමාගේ ලංකා නිල සංචාරය | | 2016 ඔක්තෝම්බර් 05 සිට 08 දක්වා |
| ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ නියෝජිතයින්ගේ නිල සංචාරය | චීනය | 2016 දෙසැම්බර් 12 සිට 20 දක්වා |

පාර්ලිමේන්තු මිත්‍ර සංගම් 50 ක් ඇති අතර එම සංගම් වලට අදාළ කටයුතු විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය මඟින් ඉටු කර ඇත.

පොදු රාජ්‍ය මණ්ඩලීය සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ සාර්ක් පාර්ලිමේන්තු සංගමය මගින් පාර්ලිමේන්තු නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද විවිධ අධ්‍යයන චාරිකා සම්බන්ධ කටයුතු, කථානායකතුමා නියෝජ්‍ය කථානායකතුමා සහ නියෝජ්‍ය කාරක සභාපතිතුමා හමුවීමට පැමිණි විවිධ රාජ්‍ය නියෝජිත කණ්ඩායම්වලට අදාළ සන්ධාන සහ මාධ්‍ය කටයුතු,මැති ඇමතිවරුන්ගේ විදේශ ගමන්වලට අදාල වීසා, ගමන් බලපත්‍ර සහ ගුවන් තොටුපළ විශේෂ අමුත්තන්ගේ පර්යන්තය වෙන්කිරීමේ කටයුතු සහ ගුවන් තොටුපළ රාජකාරී ද මෙම කාර්යාලය මඟින් ඉටු කෙරේ.


ඇමුණුම - 01
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සංවිධාන ව්‍යුහය